## පළමුවන කියැවීම

2 රාජාවලිය 4:42-44

රාජාවලියේ දෙවන පොතෙන් උපුටා ගත් කොටසකි.

**"ඔව්හු එයින් අනුභව කොට ඉතිරි කරනු ඇත."**

තවද බාල්-ෂාලියාහි සිට මනුෂ්‍යයෙක් ප්‍රථම අස්වැන්නෙන් යව රොටී විස්සක් ද අලුත් ගොයම් කරල් ද තමගේ මල්ලේ දමා ගෙන දෙවියන් වහන්සේට කැපවූ මනුෂ්‍යයා වෙත ගෙනාවේ ය. ඔහු ද, "සෙනඟට කන්න දෙන්නැ"යි කී ය. ඔහුගේ මෙහෙකරුවා, "කිමෙක්ද? මේවා මනුෂ්‍යයන් සියයක් ඉදිරියෙහි තබන්නදැ"යි ඇසී ය. එහෙත් ඔහු "ඒවා සෙනඟට කන්න දෙන්න. මන්ද, ඔවුන් අනුභව කොට ඉතිරි කරනු ඇත. කියා සමිඳුණන් වහන්සේ වදාරන සේකැ"යි පැවසී ය. එවිට ඔහු ඒවා ඔවුන් ඉදිරියෙහි තැබී ය. ඔව්හු එයින් අනුභව කොට සමිඳුණන් වහන්සේ වදාළ ලෙස ඉතිරි කළෝ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 145:10-11, 15-18

පිළිතුර: සමිඳුණෝ ජීවමාන සියල්ලන්ගේ ආසාවන් සම්පූර්ණ කරන සේක.

ගීය: සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබ වහන්සේට තුති පුදයි. ඔබේ සැදැහැවත්තුද ඔබ වහන්සේට ප්‍රශංසා කරති. ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති. ඔබේ බල මහිමය ගැන ද කතා කරති.

සියල්ලන්ගේ දෙනෙත් ඇවිටිල්ලෙන් ඔබ දෙස යොමු කර තිබේ. ඔබ ද සුදුසු කාලයේ දී ඔවුනට ආහාර දෙන සේක. ඔබ සිය හස්තය විදහා පාන සේක. ජීවමාන සියල්ලන්ගේ ආසාවන් සපුරාලන සේක.

සමිඳුණෝ සැම අතින්ම සාධාරණ ය. එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය. අයදින සියල්ලන්ට සමිඳුණෝ ළංව සිටින සේක. අවංක සිතින් යදින්නන්ට ආසන්න ව සිටින සේක.

## දෙවන කියැවීම

එපේසි 4:1-6

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**"එකම ශරීරය ය, එකම ස්වාමින් වහන්සේ ය, එකම ඇදහිල්ල ය, එකම බෞතිස්ම-ස්නාපනය ය."**

එබැවින්, දෙවියන් වහන්සේගෙන් ඔබ ලත් කැඳවීමට ඔබින ලෙස හැසිරෙන මෙන් සමිඳුණන් වහන්සේ උදෙසා හිරකාරයකු වන මම ඔබෙන් උදක්ම ඉල්ලමි. සැමවිට ම නිහතමානිව විනීත ව, ඉවසිලිවන්ත ව සිටින්න. ප්‍රේමයෙන් එකිනෙකා සමග පැහී සිටින්න. ආත්මයාණන් වහන්සේගෙන් වන එක්සත්කම, සමගිකමේ බැම්මෙන් පවත්වා ගන්නට උත්සාහ කරන්න. ඔබ කැඳවනු ලැබූ කල එකම බලාපොරොත්තුවකට කැඳවනු ලැබූ ලෙස, ඇත්තේ එකම ශරීරයත්, එකම ආත්මයාණන් වහන්සේත් ය.

එකම සමිඳුණන් වහන්සේත්, එකම ඇදහිල්ලත්, එකම බෞතිස්ම-ස්නාපනයත් ය. සියල්ලන්ට ඉහළින් සිටින, සියල්ලන් තුළින් ක්‍රියා කරන, සියල්ලන් තුළ වැඩ වසන එකම දෙවි පියාණන් වහන්සේත් ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ජුවාම් 6:63-68

ආලේලූයා! ආලේලූයා!
සමිඳුණෝ වදාළ වචන ආත්මය ද ජීවනය ද වන්නේ ය.
සදතන ජීවනයේ වචන ඇත්තේ සමිඳුණන් වෙත ය.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ජුවාම් 6:1-15

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"එහි සිටි සියල්ලන්ට තෘප්තිමත් වන තරම් කෑම ලැබිණි."**

ඉන්පසු ජේසුස් වහන්සේ ගලීල මුහුදෙන්, හෙවත් තිබේරියස් මුහුදෙන් එගොඩට වැඩම කළ සේක. ඔවුන්වහන්සේ රෝගීන් සුව කරමින් කළ හාස්කම් දුටු බැවින් මහා සමූහයක් උන්වහන්සේ පසුපස්සේ ගියහ. එවිට ජේසුස් වහන්සේ කන්දකට නැගී තමන්ගේ ශ්‍රාවකයන් සමඟ එහි වැඩහුන් සේක. ජුදෙව්වරුන්ගේ මංගල්‍යය වූ පාස්කුව ළංව තිබිණි. ජේසුස් වහන්සේ ඇස් ඔසවා බැලූ කල, තමන් ළඟට මහා සමූහයක් ඇදී එනු දැක, "මොවුන් හැම දෙනාටම කන්නට දීමට අපි කොතැනින් රොටි මිලේට ගනිමුද" යි පිලිප්ගෙන් ඇසූ සේක. උන්වහන්සේ මෙසේ වදාළේ ඔහු පරීක්ෂා කරන පිණිස ය. මන්ද තමන් කරන්න යන්නේ කුමක්දැ යි උන්වහන්සේම දැන සිටි බැවිනි. පිලිප් පිළිතුරු දෙමින්, "එකිනෙකාට ටික ටිකවත් දීමට රිදී කාසි දෙසීයයක රොටී වුවත් නොසෑහේයැ" යි කීය. ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක් වූ සීමොන් ජේදුරුගේ සොහොයුරු ඇන්ඩෘ උන්වහන්සේ අමතා, "යව රොටී පහක්ද මසුන් දෙදෙනෙකුද ඇති කොලුවෙක් මෙහි සිටියි. එහෙත් මෙපමණ දෙනෙකුන්ට එයින් කුමන පලක්දැ" යි ඇසීය. "මිනිසුන් හිඳුවන්නැ" යි ජේසුස් වහන්සේ වදාළ සේක. එතැන බොහෝ තණකොළ විය. ගණනින් පන්දහසක් පමණ පිරිමි එහි හිඳ ගත්හ. එවිට ජේසුස් වහන්සේ රොටී ගෙන තුති පුදා, හිඳගෙන සිටි අයට බෙදා දුන් සේක. එලෙසම මසුන්ගෙන්ද දුන් සේක. සියල්ලන්ට කැමති තරම් කෑම ලැබුණේය. ඔවුන් කා තෘප්තියට පැමිණි පසු, ඔවුන්වහන්සේ සිය ශ්‍රාවකයන් අමතා, "කිසිවක් නාස්ති නොවන ලෙස කැබලි එකතු කර ගන්නැ" යි වදාළ සේක. මෙසේ කෑම වැළඳූ අය, යව රොටී පහෙන් ඉතිරි කළ කැබලි එකතු කොට මළු දොළසක් පුරවාගන්නා ලදී. සමූහයා මේ හාස්කම දුටු කල "සැබැවටම මෙතුමාණෝ ලොවට වඩින්නට සිටින දිවැසිවරයාණෝ ය" යි කීහ. තමන් බලහත්කාරයෙන් අල්ලා ගෙන, රජකමට පත් කරන්නට ඔවුන් සැරසෙන බව ජේසුස් වහන්සේ දැනගෙන, නැවත තනියම කන්දට වැඩිය සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.